සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

| 11 ශ්‍රේණිය | අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2019 | 50 S I |
|---|---|---|

**නාට්‍ය හා රංග කලාව** — **කාලය පැය තුනයි**

**සැලකිය යුතුයි :- ● 1 සිට 40 දක්වා සියලුම ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරා දී ඇති කොටු කොලයේ අදාළ අංකය තුළ (x) ලකුණ යොදන්න**

## I කොටස

● **ප්‍රශ්න අංක 01 - 3 දක්වා ප්‍රශ්න වලට දී ඇති තොරතුරු ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

A - නාදය ප්‍රධාන මාධ්‍යයක් ලෙස යොදාගනී.
B - අවකාශමය හැඩතල සමුච්චයකින් නිර්මාණය වී ගොඩනැඟි ඇත.
C - කතාවක් හෝ අවස්ථාවක් ඉදිරිපත් කිරීම සිදු කරයි.
D - ගායනය ප්‍රධාන මාධ්‍යයක් ලෙස යොදා ගනී.

1 නර්තන ප්‍රසංගයක, මුද්‍ර නාට්‍ය, ඔපෙරා, සංගීත ප්‍රසංග යන ප්‍රාසාංගික කලාවන්හි ලක්ෂණ පිළිවෙලින් ගැලපූ විට වඩා නිවැරදි පිළිතුර වන්නේ,
I. A,C,D,B II. B,C,D,A III. B,A,C,D IV. D,A,B,C

● A. - සමූහයක් අතුරෙන් පුද්ගලයෙක් විශේෂ කර පෙන්වීමට.
B - සංකේත භාවිතයෙන් අදාළ පරිසරය මැවීමට.
C - ප්‍රේක්ෂකයාට චරිත හඳුනා ගැනීමට ප්‍රබල ඉඟියක් ලැබීමට.
D - සාත්වික අභිනය මැනවින් නිරූපනය කිරීමට.

2. වේෂ භූෂණ, අංගරචනය, පසුතල නිර්මාණ, රංගාලෝකය, යන ආහාර්ය අභිනයට අයත් අංග වල ලක්ෂණ පිළිවෙලින් ගැලපූ විට වඩා නිවැරදි පිළිතුර වන්නේ,
I. C,D,B,A II. A,B,D,C III.B,A,C,D IV. B,C,D,A

● A - ගම දූව නරියාට සරණ පාවා දෙන අවස්ථාව.
B - විකෘති නාට්‍යයේ ප්‍රියංගනී විදේශ මහත්තයාගේ ලෙඩ පරීක්ෂා කරන අවස්ථාව.
C - මනමේ නාට්‍යයේ වැදි රජු හා මනමේ කුමරු අතර සටන.
D - හුණුවටයේ නාට්‍යයේ මයිකල් කුමාරයා හුණුවටයේ තියා දෙපැත්තට ඇදීම.

3. නාට්‍යධර්මී ශෛලියට අයත් නාට්‍යයක ගැටුම් අවස්ථාවක් වන්නේ,
I. A II. B III. C IV. D

● A - භරත නාට්‍යම් E - සවරං
B - ලී කෙළි F - වඩිග පටුන
C - නානුමුරය G - කළගෙඩි
D - මනිපුරි H - වන්නම්

**ඉහත තොරතුරු ඇසුරෙන් අංක 04 - 05 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න,**

04. ශෝභමානව හා දෘෂ්‍ය රූපයක් සහිතව ඉදිරිපත් කරන නර්තනාංග ඇතුළත් වඩා නිවැරදි පිළිතුර වන්නේ,
I. B,E,G,H II. C,E,F,H III. E,F,G,H IV. A,C,D,F

5. කිසියම් අර්ථයක් හෝ භාවයක් දැක්වෙන තලාන්විත නර්තනාංග ඇතුලත් වඩා නිවැරදි පිළිතුර වන්නේ,
I. A,C,D,E II. C,D,F,H III. A,B,C,F IV. A,C,D,F

**අංක 06 සිට 09 දක්වා ප්‍රශ්න වලට නොගැළපෙන පදය තෝරන්න,**

06. I. කමත II. තානායම්පොළ III. ගිනිමැල භූමිය IV. නූතන වේදිකාව
07. I. වුත් එනමල් II. නෝස් පොටි III. ස්පොන්ජ් IV. පෑන් කේක්
08. I. ශ්වසන අභ්‍යාස II. ඇස පිළිබඳ අභ්‍යාසය III. ශිථිලකරණ අභ්‍යාස IV. සංවේදන අභ්‍යාස
09. I. එළුවන් කෑම II. ගස් දෙකේ යුද්ධය III. රාක්ෂයෙක් ගමට ඇවිත් IV. පෙරළුණු ඔරුව

පහත තොරතුරු ඇසුරෙන් අංක 10-12 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(අ) ගම්හිර තෙදැති කොස්තන්තිනු පුරේ...
(ආ) ලප නොමවත් සඳ සේ සොම් ගුණෙනා...
(ඉ) යහපති ස්වාමිණි
ගෝලයිනි විසදීමට ඇති මේ පැනය සාවධානව අසනු.
(ඊ) විස්ස තිහ උනත් මට කමක් නෑ. මම කියලා දෙන්නම් ඔහේගේ නීතිය ගැන

10. "අ" අක්ෂරයේ නාට්‍ය ගීතය ඇතුලත් නාට්‍ය වන්නේ,
I. රාමායනය II. බැලසන්න III. ගුරුතරුව IV. සිරිසඟබෝ

11. "ආ" අක්ෂරයට අදාළ නාට්‍ය ගීතය ගායනා කරනු ලබන්නේ,
I. සිංහබාහු නාට්‍යයේ - සුප්පා දේවී II. වෙස්සන්තර නාට්‍යයේ - මන්ද්‍රී දේවී
III. මනමේ නාට්‍යයේ - මනමේ කුමාරිය IV. දික්තල කාලගෝල නාට්‍යයේ - දික්තලා

12. "ඉ" අක්ෂරයට අදාළ " දික්තල කාලගෝල නාට්‍යයේ " සංවාද කණ්ඩය කව්රුන් විසින් කා හට කියන ලද්දක් ද?
I. මහෞෂධ පඬිතුමා විසින් - කාලගෝල වෙත. II. දික්තල විසින් - දික්පිටියා වෙත
III. චතතුදත්ත විසින් - කාලගෝලයාට IV. චතතුදත්ත විසින් - මහෞෂධ පඬිතුමා වෙත

13. "ඊ" අක්ෂරයට අදාළ සංවාද ඛණ්ඩය ඇතුලත් නාට්‍ය වන්නේ,
I. කපුවා කපෝති II. බෙරහඬ III. සක්කායදිට්ඨි IV. හුණුවටයේ කතාව

14. අංග රචනා ශිල්පියෙකු සතු ගුණාංගයක් **<u>නොවන්නේ,</u>**
I. තම මතයට අනුව කටයුතු කළ යුතුය. II. සමේ වර්ණය පිළිබඳ දැනගත යුතුය.
III. ශිල්පිය කුසලතාවයෙන් යුක්ත විය යුතුය. IV. රංග ශෛලිය හා තේමාව අවබෝධ කරගත යුතුය.

15. ක්ෂණික නිරූපණයට අදාළ ලක්ෂණයක් **<u>නොවන්නේ,</u>**
I. අවස්ථාවක් හෝ සිද්ධියක් පාදක කර ගැනීම. II. සරල රංග භාණ්ඩ රංගනය සඳහා භාවිත කළ හැකි වීම.
III. පෙර සුදානමකින් යුතුව ඉදිරිපත් කිරීම. IV. ඒකල හා සාමුහික වශයෙන් ඉදිරිපත් කළ හැක.

16. හාස්‍යෝත්පාදක පූර්ව රංගයක් හා නාට්‍යමය ගුණයෙන් යුතු අපර රංගයක් සහිත ගැමි නාට්‍ය කුමක්ද?
I. සොකරි II. කෝලම් III. නාඩගම් IV. රූකඩ

17. සොකරි නාට්‍යයට සුවිශේෂි වු ලක්ෂණයක් වන්නේ,
I. අනුකරණ මාධ්‍යයෙන් කථා පුවතක් ඉදිරිපත් කිරීම. II. විවිධ ශාන්තිකර්ම වල අංග ඇතුළත්වී තිබීම.
III. කාන්තාවන් රංගනයෙන් දායක වීම. IV. දකුණු ඉන්දිය කර්ණාටක සංගීතය යොදා ගැනීම.

18. නාඩගම් කලාවේ පුරෝගාමීයා වූයේ,
I. පිලප්පු සිඤ්ඤෝය II. සීදොන් බස්තියන්ය III. මෝදර පැලීස් අප්පුහාමිය IV. චාර්ලිස් ද ආබෲව්ය

19. මිනර්වා නාට්‍යයක් වන්නේ,
I. පිටිසර කෙල්ල II. පුස්ලෝඩං III. කඩවුණු පොරොන්දුව IV. සෝෂක වස්තුව

20. ලාසක් විතර වී අව්වේ වනාලා
දොලසක් විතර ඇඟ ගෝමර ඉසීලා යන කවි ගායනය ඇතුළත් වන්නේ,
I. ඌරායක්කමේය II. නයායක්කමේය III. ගබඩා කොල්ලයේය IV. ගුරුගේ මාලාවේය.

21. පත්තිනි දේවියගේ උප්පත්තිය පිළිබඳව කියවෙන අන්තර් රංග අවස්ථාව වන්නේ,
I. අඹවිදමන II. රාමා මැරීම III. සීතායක්කම IV. වඩිග පටුන

22. උඩරට ප්‍රදේශයට ආවේණික ශාන්ති කර්මයක් වන්නේ,
I. කොහොඹා කංකාරිය II. සුනියම් යාගය III. ගම්මඩුව IV. දහ අට සන්නිය

23. "සුවිසි විවරණ " අයත් වන්නේ,
I. බෞද්ධ පූජා කර්මයටය III. ශාන්තිකර්මයක අඩංගු නාට්‍යමය අවස්ථාවකටය
II. පිරිත් පිංකමටය IV. ග්‍රහ ශාන්ති කර්මයටය

24. හින්දු භක්තිකයන් විසින් තෛයිපොංගල් උත්සවය පවත්වනු ලබන්නේ,
I. ජනවාරි මාසයේය II. අප්‍රේල් මාසයේය III.මැයි මාසයේය IV.සැප්තැම්බර් මාසයේය

25. රාමසාන් උත්සවය පවත්වන්නේ,
I. හින්දු භක්තිකයන් විසිනි II. ක්‍රිස්තු භක්තිකයන් විසිනි
III. ඉස්ලාම් භක්තිකයන් විසිනි IV. බෞද්ධ ආගමිකයින් විසිනි

**පහත දැක්වෙන වගුව ඇසුරෙන් 26 - 29 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න,**

| | | | |
|---|---|---|---|
| A<br>යෙර්මා<br>ඉක්නෙවිටාඉ<br>ද ග්ලාස් මෙනාජරි | ඇන්ටන් චෙකොෆ්<br>B<br>සොෆොක්ලීස්<br>ටෙනසි විලියම් | මඟුල් ප්‍රස්ථාව<br>මුහුදු පත්තු<br>C<br>අහස් මාලිගා | යූ.ඒ ගුණසේකර<br>ගුණසේන ගලප්පත්ති<br>බන්දුල ජයවර්ධන<br>D |

26. B අක්ෂරයට අදාළ වියයුතු නාට්‍ය කරුවා වන්නේ,
I. බර්ටොල් බ්‍රෙෂ්ට්ය II. නිකොලායි ගොගොල්ය III. ගර්ෂියා ලෝකාය IV. ටෙනසි විලියම්ය

27. A අක්ෂරයෙන් දැක්වෙන නාට්‍ය කෘතිය වන්නේ,
I. ද ප්‍රොපෝසල් II. රූඩන්ස් III. මැරේජ් IV. ද ඩ්‍රැගන්

28. C අක්ෂරයට අදාළ අනුවර්තන කෘතිය වන්නේ,
I. වෙස්මුහුණු II. බෙරහඬ III. සකලජන IV. මහගෙදර

29. D අක්ෂරයට අදාළ නාට්‍යකරුවා වන්නේ,
I. රංජිත් ධර්මකීර්ති II. සුගතපාල ද සිල්වා III. බන්දුල විතානගේ IV. හෙන්රි ජයසේන

30. විශ්ව විද්‍යාලීය නාට්‍ය කලාව බිහි කිරීමට පුරෝගාමී වූ මහචාර්යවරයා වන්නේ,
I. E.F.C. ලුඩෝවයික් ය III. බර්ටොල්ට් බ්‍රෙෂ්ට් යII. බර්නාඩ් ෂෝ ය IV. ඔස්කාවයිල්ඩ් ය.

31. විශ්ව විද්‍යාලය මගින් ප්‍රථමයෙන් රඟ දැක්වූ ඉංග්‍රීසි නාට්‍ය වන්නේ,
I. වෙයාවිමෙන් රූල් II. ද රයිවල්ස් III. මයික්‍රො මිලියන් IV. රයිට් යූ ආර්

**නොගැළපෙන පිළිතුර තෝරන්න,**

32. විශ්ව විද්‍යාලයේ සිංහල සමිතිය මඟින් රඟ දැක්වූ නාට්‍ය වන්නේ,
I. ඉබේ වෙදා II.යන්තම් ගැලවුණා III. මුදලාලිගේ පෙරළිය IV. ජනේලය

33. බර්ටොල්ට් බ්‍රෙෂ්ට්ගේ නාට්‍ය කෘති ඇසුරෙන් මෙරට නිෂ්පාදය වූ නාට්‍ය වන්නේ,
I. හුණු වටයේ කතාව III. පැන්සතුනේ කතාව III. හිත හොඳ අම්මණ්ඩි. IV. රෝමය ගිනි ගනී

**නිවැරදි පිළිතුර තෝරන්න**

34.වැනීසියේ වෙළෙන්දා නාට්‍යයෙන් රංගනයට පිවිසි රංගන ශිල්පියා වන්නේ,
I. රත්නාලාලනිය II. කෞශල්‍යා ප්‍රනාන්දුය III. චාන්දනි සෙනවිරත්නය IV. මානෙල් ජයසේනය

35. රම්‍යා වනිගසේකර රංගනයෙන් දායක වූ චරිතයක් වන්නේ,
I. ලිහිණි නාට්‍යයේ - මොලි
III. මනමේ නාට්‍යයේ - මනමේ කුමරි
II. විකෘති නාට්‍යයේ - මැටිල්ඩා
IV. කැලණිපාලමේ - රූපවතී.

36. " වීදි රැජිනි" ලෙස විරුදාවලී ලබා ඇති රංගන ශිල්පිනිය වන්න්,
I. දීපානිද සිල්වා II. අනුලා බුලත්සිංහල III. චාන්දනි සෙනවිරත්න IV. මැණිකේ අත්තනායක


**ඡායාරූප හා සම්බන්ධ නොවන වරණය තෝරන්න**

37.



I. ජනේලය
II. කුවේණි
III. අපට පුතේ මඟක් නැතේ
IV. මහාසාර


38.



I. කැළණි පාලම
II. ජේලර් උන්නැහේ
III. ලෝකය තනියායක්
IV. ලෙඩක් නැති ලෙඩෙක්

39. 

I. මහගිරි දඹ
II. පුස්ලෝඩං
III. තලමල පිපිලා
IV. ගුරුතරුව

40. 

I. බීජ දැක්ම
II. පිං පෙට්ටිය
III. රූකඩයෝ
IV. ද්විත්ව

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

11 ශ්‍රේණිය | අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2019 | 50 S II

**නාට්‍ය හා රංග කලාව** | කාලය පැය තුනයි

සැලකිය යුතුයි :- ● පළමු ප්‍රශ්නය ඇතුළු තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

II කොටස

01. 01. විකෘති නාට්‍යයේ නිර්මාණකරුවා නම් කරන්න.
02. විකෘති නාට්‍යයේ තේමාව කුමක්ද?
03. විකෘති නාට්‍යයේ පළමු රංගනය ආරම්භ වන්නේ කෙසේද?
04. විකෘති නාට්‍යයේ ඇඳුම් නිර්මාණය කර ඇත්තේ කවුරුන් විසින්ද?
05. මෙම නාට්‍යයේ බේදවාචකයට මුහුණ දෙන චරිත මොනවාද?
06. නාට්‍යයේ ප්‍රධාන ගැටුම ගොඩ නැගෙන්නේ කා අතරද? (2x6=12)

02. I. බෞද්ධ පූජාකර්ම 2 ක් හා සබරගමු සම්ප්‍රදායට අයත් ශාන්ති කර්ම 2ක් ලියන්න. (ල:2)
II. පහතරට ශාන්ති කර්ම 2ක් නම්කර එහි නාට්‍යමය අවස්ථා 2 බැගින් ලියන්න. (ල:4)
III. එම නාට්‍යමය අවස්ථා දෙකක අන්තර්ගත නාට්‍යමය ලක්ෂණ 04 ක් උදාහාරණ සහිතව විස්තර කරන්න. (ල:6)

03. I. නාඩගම් ප්‍රභවය පිළිබඳව මත 02ක් ලියන්න. (ල:2)
II. පිලිප්පු සිංඤෝ විසින් නිර්මාණය කරන ලද නාඩගම් නාට්‍ය 04 ක් ලියන්න. (ල:4)
III. නාඩගම් නූර්ති නාට්‍යයෙන් වෙනස්වන ආකාරය කරුණු 05ක් ඔස්සේ විස්තර කරන්න. (ල:6)

04. I. නාට්‍යයක් යනු කුමක්ද? කෙටියෙන් හඳුන්වන්න. ( ල:2)
II. නාට්‍ය පිළිබඳ ඉදිරිපත් වී ඇති නිර්වචන දෙකක් හා එම නිර්වචන ඉදිරිපත් කළ විචාරකයින් නම් කරන්න. (ල:4)
III. කතාන්දරයක් හා නාට්‍යයක් අතර සමාන අසමානතා තුන බැගින් සංසන්දනාත්මකව පැහැදිලි කරන්න. (ල:6)

05. I. නාට්‍යක සාර්ථකත්වය සඳහා බලපාන ආනුෂාංගික අංග හතරක් නම් කරන්න. (ල:2)
II. ඔබ ඉහත නම් කළ අංග දෙකක් පැහැදිලි කරන්න. (ල:4)
III. ඉහත ආනුෂාංගික අංග ඔබ නරඹා ඇති නාට්‍යක කෙසේ යොදා ගෙන ඇද්දැයි පැහැදිලි කරන්න. (ල:6)

06. I. කෙටි නාට්‍යයක් යනු කුමක්දැයි හඳුන්වන්න. (ල:2)
II. කෙටි නාට්‍යය නිර්මාණ කරුවන් දෙදෙනෙක් හා ඔවුන්ගේ නිර්මාණ එක බැගින් නම් කරන්න. (ල:4)
III. කෙටි නාට්‍යකට අදාළ සුවිශේෂී ලක්ෂණ 06ක් සඳහන් කරන්න. (ල:6)

07 අමතර විද්‍යා පන්තියකට සහභාගි වූ ගයනි හවස් වූ බැවින් ළහි ළහියේ බස් නැවතුම් පළට පැමිණියේ පියා තමාව කැටුව යාමට පැමිණ ඇතැයි බලාපොරොත්තුවෙනි. පියා අද නොයෙන බවත් කලින් ගෙදර යන ලෙසත් කියූ බව සිහි වූයේ පියා පැමිණ නොමැති බව දුටු විටයි. ඇය පාරේ යන ත්‍රිවිලර් නතර කර ගත්තේ සොහොන් කනත්ත ළඟින් පයින් තනිව යාමට නොහැකි හෙයිනි. වේගයෙන් ගිය ත්‍රිවිලර් රථය කනත්ත ළඟ දී කැඩී නතර විය.

1. රංග විධාන සහිතව පෙළ රචනය (ල:4)
2. නාට්‍යෝචිත අවස්ථා ගොඩනැගීම (ල:8)

# තෙවන වාර පරීක්ෂණය - 2019

## නාට්‍ය හා රංග කලාව

11 ශ්‍රේණිය

## පිළිතුරු පත්‍රය - I

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01 | ii | 11 | iii | 21 | i | 31 | i |
| 02 | i | 12 | iv | 22 | i | 32 | iv |
| 03 | iii | 13 | iv | 23 | i | 33 | iii |
| 04 | i | 14 | i | 24 | i | 34 | iii |
| 05 | i | 15 | iii | 25 | ii | 35 | i |
| 06 | iv | 16 | ii | 26 | iii | 36 | i |
| 07 | iii | 17 | i | 27 | i | 37 | iv |
| 08 | ii | 18 | i | 28 | ii | 38 | iii |
| 09 | i | 19 | ii | 29 | iv | 39 | ii |
| 10 | ii | 20 | ii | 30 | i | 40 | iv |